# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[233 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය:* මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට යටත් වන්නා වූ යම් ගනුදෙනුවකට ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ වීම බැහැර කිරීම වේ.

*3 වන වගන්තිය:* මෙම වගන්තිය මගින්, චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන්නා වූ විධිවිධාන සැලැස්වීම පිණිස 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත සම්මත කිරීමට ආනුෂංගිකව, චංචල දේපළ පිළිබඳ සුරකු අයිතිවාසිකම් ඇති කරන සාධන පත්‍ර ලියාපදිංචි කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය ඉවත් කරනු ලැබේ.

*4 වන වගන්තිය:* මෙම වගන්තිය මගින්, චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන්නා වූ විධිවිධාන සැලැස්වීම පිණිස 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත සම්මත කිරීමට ආනුෂංගිකව, ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වීම ඉඩම්වලට බලපාන සාධනපත්‍රවලට සීමා කිරීම සඳහා එම පරිච්ඡේදයේ ශීර්ෂය ප්‍රතියෝජනය කරනු ලැබේ.

*5 වන වගන්තිය:* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන්නා වූ විධිවිධාන සැලැස්වීම පිණිස 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත සම්මත කිරීමට ආනුෂංගිකව, ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වීම ඉඩම්වලට බලපාන සාධන පත්‍රවලට පමණක් සීමා කිරීම වේ.

*6 වන වගන්තිය:* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය මෙම පනත් කෙටුම්පතේ 5 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය:* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය මෙම පනත් කෙටුම්පතේ 5 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*8 වන වගන්තිය:* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය මෙම පනත් කෙටුම්පතේ 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*9 වන වගන්තිය:* මෙම වගන්තිය මගින්, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ දැනටමත් ලියාපදිංචි කොට ඇති සාධන පත්‍ර බලාත්මකව පවතින කාලසීමාව පිළිබඳව සහ 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව එම සාධන පත්‍ර තවදුරටත් බලාත්මක කළ හැකි වීම සඳහා සහ ඒවායේ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්වීම සඳහා එම සාධන පත්‍ර එම පනත යටතේ ලියාපදිංචි කළ යුතු වීමේ අවශ්‍යතාවය පිළිබඳව විධිවිධාන සලස්වනු ලැබේ.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

එල්.ඩී.-ඕ. 69/2017

## (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

**1.** (1) මේ පනත 2024 අංක      දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

*117 වන අධිකාරයේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 8 වන වගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ (xi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(xii) 2024 අංක      දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට යටත් වන්නා වූ ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් ගිවිසුමක්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය ඉවත් කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය (16 වන වගන්තියේ සිට 24 වන වගන්තිය දක්වා ඒ වගන්ති දෙක ද ඇතුළත්ව) මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

"V වන පරිච්ඡේදය

**ඉඩම්වලට බලපාන සාධන පත්‍රවලට අදාළ විධිවිධාන"**

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ "ඉඩමකට හෝ ඔඩපනයකට, උකසකට හෝ විකුණුම් බිල් පත්‍රයකට බලපාන සාධන පත්‍රයක්" යන වචන වෙනුවට "ඉඩමකට බලපාන සාධන පත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඉඩමකට හෝ චංචල දේපළකට බලපාන" යන වචන වෙනුවට"ඉඩමකට බලපාන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"දිස්ත්‍රික්ක කිහිපයක

පිහිටි ඉඩම්"

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ "තමා විසින් ලියාපදිංචි කරන ලද ඉඩම්වලට සහ ඔඩපනවලට, උකස්කරවලට හෝ විකුණුම් බිල්පත්‍රවලට බලපාන සාධන පත්‍ර පිළිබඳව" යන වචන වෙනුවට "තමා විසින් ලියාපදිංචි කරන ලද ඉඩම්වලට බලපාන සාධන පත්‍ර පිළිබඳව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ III වන කොටසෙහි 2 වන අයිතමයෙහි "III වන, IV වන, V වන, VI වන පරිච්ඡේද යටතේ පවත්වාගෙන යනු ලබන යම් පොතක් හෝ සුචියක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "III වන, V වන හෝ

VI වන පරිච්ඡේදය යටතේ පවත්වාගෙන යනු ලබන යම් පොතක් හෝ සුචියක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරන ලද සාධන පත්‍රවල බලාත්මකභාවය

**9.** (1) නියමිත දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති-

(අ) චංචල දේපළ පිළිබඳ ඔඩපනයක්,උකසක් හෝ විකුණුම් බිල් පත්‍රයක්; හෝ

(ආ) (i) යම් නිශ්චල දේපළක සවිකිරීමක් හා සම්බන්ධ යම් බැඳියාවක්; හෝ

(ii) යම් නිශ්චල දේපළක උකසක්, සෘණභාරයක් හෝ බද්දක් යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරා දීමේ දී ඒ පවරාදීම මගින් එම නිශ්චල දේපළ කෙරෙහි වන පැවරුම්කරුගේ බැඳියාව භාරදීම හෝ පැවරීම සිදුනොවන අවස්ථාවක, එවැනි පවරාදීමක්,

ඇති කරන යම් සාධන පත්‍රයක් බලාත්මකව පවතින අවස්ථාවක දී, නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ඒ චංචල දේපළ පිළිබඳ ඔඩපනය, උකස හෝ විකුණුම් බිල් පත්‍රය හෝ ඒ නිශ්චල දේපළෙහි සවිකිරීම හා සම්බන්ධ බැඳියාව හෝ ඒ නිශ්චල දේපළෙහි උකස, සෘණභාරය හෝ බද්ද යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීම තවදුරටත් බලාත්මක විය යුතු නමුත්, ඒ අවුරුදු දෙකක කාලසීමාව ඉකුත් වීමට පෙරාතුව ඒ චංචල දේපළ පිළිබඳ ඔඩපනය, උකස හෝ විකුණුම් බිල් පත්‍රය හෝ ඒ නිශ්චල දේපළෙහි සවිකිරීම හා සම්බන්ධ බැඳියාව හෝ ඒ නිශ්චල දේපළෙහි උකස, සෘණභාරය හෝ බද්ද යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීම 2024 අංක      දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ අදාළ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට ඒ සාධන පත්‍රය මුලින් ම නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි සාධන පත්‍රයක් බවට පත් වූයේ යම් දිනයක ද, ඒ දිනයේ සිට පරිපූර්ණත්වයට පත් වූ ලෙසට සලකනු ලැබිය යුතු අතර, ඒ සාධන පත්‍රය මුලින් ම නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි සාධන පත්‍රයක් බවට පත් වූ අවස්ථාවේ දී හිමිකම් ලැබුවේ යම් ප්‍රමුඛතාවකට ද ඒ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්විය යුතු ය.

(3) නියමිත දිනයේ සිට අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙරාතුව 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු නොලබන (1) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව නීත්‍යනුකූලව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.